14560

OL/2017/21/S-I, II (OLD)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

OLD

21 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

| | | |
|---|---|---|
| සිංහල භාෂාව හා සාහිත්‍යය I, II | | පැය තුනයි |
| சிங்களமொழியும் இலக்கியமும் I, II | | மூன்று மணித்தியாலம் |
| Sinhala Language and Literature I, II | | Three hours |

## සිංහල භාෂාව හා සාහිත්‍යය I

**සැලකිය යුතුයි :**
(i) **සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න.** මෙම ප්‍රශ්න පත්‍රය සඳහා **ලකුණු 40ක්** ලැබේ.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.
(iii) **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**
(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

● අංක **1** සිට **3** තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථයට **වඩාත් සමීප අර්ථය** දෙන උත්තරය තෝරන්න.

**1.** ඔහු සෑම විට ම සමාජයේ යහපත වෙනුවෙන් **උරදුන්** පුද්ගලයෙකි.
(1) වෙහෙස මහන්සි වූ (2) මුදල් සොයාදුන්
(3) සහාය දැක්වූ (4) භාණ්ඩ ලබාදුන්

**2.** ඔහු **කැස කවන්නේ** කවර කාර්යයකට දැයි කිසිවෙක් නොදනිති.
(1) සූදානම් වන්නේ (2) ගමන් කරන්නේ (3) වැඩ කරන්නේ (4) බලා සිටින්නේ

**3.** ඔවුන්ගේ **පයුරුපාසානම** එතරම් හොඳ නැති බව සෑම දෙනාගේ අදහසයි.
(1) රහස් සාකච්ඡාව (2) ආශ්‍රය
(3) කුමන්ත්‍රණය (4) සංවාදය

● අංක **4** සිට **6** තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට **වඩාත් සුදුසු** පදය තෝරන්න.

**4.** ලේඛකයෙකුට තම .............................. දෙස අභිමත ආකාරයකින් බැලිය හැකි ය.
(1) කල්පිතය (2) උපකල්පනය (3) ප්‍රතිභාව (4) අනුභූතිය

**5.** ආහාරයක් ලැබුණු විට එය සෙස්සන් හා බෙදා ගැනීමේ සමුපකාර ක්‍රමය චිම්පන්සින්ගේ .............................. පුරුද්දකි.
(1) චිරාගත (2) අනුගත (3) පාරිසරික (4) අනුමත

**6.** තරුපිරි අහස ..................... ය.
(1) ප්‍රතාපවත් (2) තෙදවත් (3) අසිරිමත් (4) සාරවත්

**7.** අකාරාදි පිළිවෙළ **නිවැරදි ව** යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) අමාවතුර, බුත්සරණ, පූජාවලිය, ධර්මප්‍රදීපිකාව (2) අමාවතුර, පූජාවලිය, බුත්සරණ, ධර්මප්‍රදීපිකාව
(3) අමාවතුර, ධර්මප්‍රදීපිකාව, බුත්සරණ, පූජාවලිය (4) අමාවතුර, ධර්මප්‍රදීපිකාව, පූජාවලිය, බුත්සරණ

**8.** සෑම පදයක ම අක්ෂර වින්‍යාසය **නිවැරදි ව** යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) ආදර්ශය, උත්කෘෂ්ඨ, මුදල් ඇනවුම, අර්ථාන්විත (2) අලුත්වැඩියාව, ජීවිතාවබෝධය, පරිහරණය, දූර්මුඛ
(3) කාව්‍යශේඛරය, වලාකුල, ස්වාධීනත්වය, වික්ෂිප්ත (4) ශීඝ්‍රගාමී, උනුසුම, අලුයම, ආශීර්වාදය

**9.** **මියුරුගී** යන පදය අයත් වන්නේ,
(1) අව්‍යය සමාසයට ය. (2) විශේෂණ සමාසයට ය. (3) විභක්ති සමාසයට ය. (4) අන්‍යාර්ථ සමාසයට ය.

[දෙවැනි පිටුව බලන්න.

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

10. 'ගගනි ගීතයක් ගයමින් පහන දැල්වූවා ය.' යන වාක්‍යයේ ගයමින් යනු,
(1) පූර්ව ක්‍රියාවකි. (2) ආශීර්වාද ක්‍රියාවකි. (3) අසම්භාව්‍ය ක්‍රියාවකි. (4) මිශ්‍ර ක්‍රියාවකි.

11. **අනියමාර්ථ උක්ත නාම පද** පමණක් යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) නිළියක, දැරියක, වෙළෙන්දකු, තරුණයකු (2) කාන්තාවක්, ගායිකාවක්, රියදුරෙක්, නිලධාරියෙක්
(3) සිංහයෝ, දරුවෝ, ක්‍රීඩකයෝ, ගුරුවරු (4) නිලධාරීන්, පාරිභෝගිකයෝ, මිනිසුන්, විරුවෝ

12. **උපසර්ගයක්** සහිත පදයක් ඇතුළත් **නො වන** වරණය තෝරන්න.
(1) විවාහය, අසරණ, අනුබලය, පන්සිල් (2) අවගුණ, පිරිසිදු, නිගරු, නිසංසල
(3) විවෘත, දුසිරිත්, දුබල, පිළිතුරු (4) අබිමන, අදීන, අපවාද, විදෙස්

13. 'යම් කෙනකු විසින් කරන ලද සේවය ඇගයීමට ලක් කිරීම' යන්න සඳහා යෙදිය හැකි තනි පදය කුමක් ද?
(1) උපයෝගය (2) උපකාරය (3) උපහාරය (4) උපහාසය

● අංක 14 සිට 16 තෙක් ප්‍රශ්නවල **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන උත්තරය තෝරන්න.

14. නියං සහනාධාර නිසා ජනතාවට බොහෝ **ප්‍රතිලාභ** ලැබුණි.
(1) භාණ්ඩ (2) උපකාර (3) ප්‍රශංසා (4) ප්‍රයෝජන

15. ඔහු ඇසුරු කළේ **හිතෛෂීන්** කිහිප දෙනකු පමණි.
(1) හිතවතුන් (2) විද්වතුන් (3) බලවතුන් (4) ධනවතුන්

16. විදේශ සංචාරයක නිරත වීම ඔහුගේ **අභිලාෂය** විය.
(1) ඇඩි උනන්දුව (2) ඇඩි උත්සාහය
(3) ඇඩි විශ්වාසය (4) ඇඩි අවශ්‍යතාව

17. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් **නො වන** පදයක් සහිත උත්තරය තෝරන්න.
(1) ද්කාරාර්ථ සමාසය - නායකනායිකාවෝ, තෙල්මල්පහන්, ශිෂ්‍යශිෂ්‍යාවෝ, ගස්වැල්
(2) අව්‍යය සමාසය - අස්ථිර, නොමඳ, නිදොස්, කරුණාවන්ත
(3) ස්වර සන්ධිය - මලසුන, මුලිනුපුටා, නිලඹර, ඔවුනොවුන්
(4) තද්ධිත - රමණීය, ඉන්දියානු, මාසික, දැහැමි

18. ජීවනෝපාය යන වචනය නිවැරදිව විසන්ධි කර ඇති උත්තරය තෝරන්න.
(1) ජීවන + උපාය (2) ජීවනෝ + පාය (3) ජීව + නෝපාය (4) ජීවන් + ඕපාය

19. මුලින් දී ඇති පදයට සමානාර්ථයක් **නො දෙන** පදයක් ඇතුළත් පද පේළිය තෝරන්න.
(1) අවවාද - ඔවා, ඔවදන්, උපදෙස්, දැනමුතුකම්
(2) අශ්වයා - හය, සෛන්ධව, තුරඟ, අස්
(3) ගල - ශෛල, සල, පහණ, තුර
(4) ප්‍රසිද්ධ - පසිඳු, පතළ, ප්‍රකට, ප්‍රචලිත

20. **පූර්ව ක්‍රියාපදයක්** යෙදී ඇති වාක්‍යය තෝරන්න.
(1) පාරේ ගමන් කරද්දී දකුණු පසින් ගමන් කරන්න. (2) කම්කරුවා වැඩබිම වෙත යාමට සෙමෙන් පියනගයි.
(3) නැවතෙමින් ඉදිරියට යනු. (4) මම ඉදිරියට ගොස් දකුණට හැරුණෙමි.

21. **විරුද්ධාර්ථවත්** පද යුගලයක් **නො වන** උත්තරය තෝරන්න.
(1) අනුමාන - ප්‍රත්‍යක්ෂ (2) සම්භාවනීය - නින්දනීය
(3) සුලබ - විරල (4) ස්ථාවර - ස්ථිර

22. **වැරදි** අදහස සහිත උත්තරය තෝරන්න.
(1) ආහාරපාන සුලබව පවතින සාමකාමී ප්‍රදේශය ක්ෂේම භූමිය ය.
(2) පාර තොට යනු යුගල පදයක් සඳහා උදාහරණයකි.
(3) ළමයින් යනු බහු වචන උක්ත පදයකි.
(4) 'දාරුමය' යන වචනයෙහි දැවයෙන් තනන ලද යන අර්ථය ඇත.

23. **මහාප්‍රාණ** අක්ෂර පමණක් ඇතුළත් වරණය තෝරන්න.
(1) ඨ, ඛ, ඝ, ධ (2) ඡ, ඤ, ඝ, ඨ (3) භ, ද, ඨ, ඪ (4) ෂ, ඨ, ඵ, ධ

[තුන්වැනි පිටුව බලන්න.

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

- අංක **24** සිට **26** තෙක් දී ඇති ප්‍රස්තාව පිරුළුවලට **වඩාත් ගැළපෙන** අදහස තෝරන්න.

**24.** කළ නොහැකි දේවලට උත්සාහ දැරීම
(1) අටුව කඩා පුටුව හැදුවා වගේ (2) ලේනා වලිගයෙන් මුහුද ඉස්සා වගේ
(3) වක්කඩේ හකුරු හැංගුවා වගේ (4) ඉබ්බාගෙන් පිහාටු ඉල්ලුවා වගේ

**25.** යම් කාර්යයක් අපිළිවෙළට සිදු කිරීම
(1) යක්කු පොල් හිටෙව්වා වගේ (2) අන්දරේ සීනි කෑවා වගේ
(3) කණා ගල් ගහන්නා වගේ (4) ඇතාට අටුකොස් දුන්නා වගේ

**26.** ලිහාගත නොහැකි ගැටලුවකට මැදි වී සිටීම
(1) ඇටි කෙහෙල් කෑ උගුඩුවා වගේ (2) ඇම ගිලපු මාළුවා වගේ
(3) ගඟට ඉනි කැපුවා වගේ (4) නැග්ග ඉණිමගට පයින් ගැහුවා වගේ

- අංක **27** සිට **29** තෙක් ප්‍රශ්නවල **ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍යය** තෝරන්න.

**27.** (1) විදුහල්පතිවරු හෝ ගුරුවරු රැස්වීමට සහභාගි වෙති.
(2) විදුහල්පතිවරුන් හෝ ගුරුවරු රැස්වීමට සහභාගි වෙති.
(3) විදුහල්පතිවරුන් හෝ ගුරුවරුන් රැස්වීමට සහභාගි වෙති.
(4) විදුහල්පතිවරු හෝ ගුරුවරුන් රැස්වීමට සහභාගි වෙති.

**28.** (1) දෙවියන් වැනි මිනිසුන් අප අතර සිටිති. (2) දෙවියෝ වැනි මිනිස්සු අප අතර සිටිති.
(3) දෙවියන් වැනි මිනිස්සු අපි අතර සිටිති. (4) දෙවියෝ වැනි මිනිසුන් අප අතර සිටිති.

**29.** (1) රැස්වීමට මිනිස්සු පැමිණෙති'යි සංවිධායකයෝ සිතති.
(2) රැස්වීමට මිනිසුන් පැමිණෙති'යි සංවිධායකයෝ සිතති.
(3) රැස්වීමට මිනිස්සු පැමිණෙති'යි සංවිධායකයන් සිතති.
(4) රැස්වීමට මිනිසුන් පැමිණෙති'යි සංවිධායකයන් සිතති.

**30.** පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට **වඩාත් නිවැරදි** ලෙස ලැබෙන වාක්‍යය තෝරන්න.
"ළමයි ඉගෙන ගත්තොත් දෙමාපියන් සතුටු වෙනවා."
(1) ළමයි ඉගෙන ගත්තොත් දෙමාපියෝ සතුටු වෙති.
(2) ළමයින් ඉගෙන ගතහොත් දෙමාපියන් සතුටු වෙති.
(3) ළමයින් ඉගෙන ගතහොත් දෙමාපියෝ සතුටු වෙති.
(4) ළමයි ඉගෙන ගත්තොත් දෙමාපියන් සතුටු වෙති.

**31.** 'වියොවග ලෙළ දද සිරි කියෙලියා' යන පද්‍ය පාදයේ 'කොඩිය' සඳහා පර්යාය පදයක් ලෙස යෙදී ඇත්තේ,
(1) වියොවග යන්නයි. (2) ලෙළ යන්නයි.
(3) සිරි යන්නයි. (4) දද යන්නයි.

**32.** රූපකයක් සහිත කවි පදය තෝරන්න.
(1) සුරත් තඹුරු පෙති සෙ නෙතින් (2) මහනෙල් සුවඳ මය
(3) රූ රැසේ අඳිනා ලෙසේ (4) වැඳ ඔහු පද කමල

- අංක **33** සහ **34** යන ප්‍රශ්නවල මුලින් ඉදිරිපත් කර ඇති පාඨ සඳහා **වඩාත් සමීප අර්ථය** දෙන වාක්‍යය තෝරන්න.

**33.** සාහිත්‍ය විචාරයෙන් කෙරෙන්නේ සාහිත්‍ය නිර්මාණ පිළිබඳ විධිමත් බුද්ධි ගෝචර විග්‍රහ ඉදිරිපත් කිරීමයි.
(1) සාහිත්‍ය විචාරයෙන් කෙරෙන්නේ සාහිත්‍ය නිර්මාණයක් ගැඹුරු හා බුද්ධිමත් ලෙස විග්‍රහ කිරීමයි.
(2) සාහිත්‍ය විචාරයේ අපේක්ෂාව වන්නේ සාහිත්‍ය නිර්මාණ පිළිබඳ බුද්ධියට අනුකූල විධිමත් විග්‍රහයක් සිදු කිරීමයි.
(3) සාහිත්‍ය නිර්මාණයක් පිළිබඳ විධිමත් හා බුද්ධිමත් විග්‍රහයක් ඉදිරිපත් කිරීම සාහිත්‍ය විචාරයේ දී සලකා බැලෙයි.
(4) සාහිත්‍ය නිර්මාණයක බුද්ධිමත්භාවය විධිමත් ලෙස විග්‍රහ කිරීම සාහිත්‍ය විචාරයේ අපේක්ෂාවයි.

**34.** චිම්පන්සියා තමන්ට ආවේණික වූ ශබ්ද රටා මගින් සන්නිවේදන කාර්යය ඉටු කර ගැනීමට සමත් වෙයි.
(1) චිම්පන්සියා තම පණිවුඩ හුවමාරුව සිදු කරන්නේ ශබ්ද රටා මගිනි.
(2) චිම්පන්සියා තම පණිවුඩ හුවමාරුව සිදු කර ගැනීම සඳහා තමන් නිපදවාගත් ශබ්ද රටා භාවිත කරයි.
(3) චිම්පන්සියා තම පණිවුඩ හුවමාරුව සිදු කරන්නේ තමන්ට ම උරුම වූ ශබ්ද රටා භාවිතයෙනි.
(4) චිම්පන්සියා තම ශබ්ද රටා භාවිත කර අන්‍යයන් අතර පණිවුඩ හුවමාරුව සිදු කර ගනියි.



Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

**35.** "යකෙකු වගේ මිනිහෙක් ඇවිත් අපිව අල්ලා ගන්න හැදුවා, අප්පච්චි. අපේ පස්සෙන් එලවාගෙන ආවා. බය හිතෙනවා දැක්කම. දත් බොල්ලැයි. ඇස් වපරයි. කොණ්ඩෙ තඹ පාටයි. පා බකලයි."
ඉහත සඳහන් උද්ධෘතය ඇතුළත් වන නාට්‍යය කුමක් ද?

(1) වෙස්සන්තර (2) සිංහබාහු
(3) මූදු පුත්තු (4) මනමෙ

**36.** පහත සඳහන් කවියේ හිස්තැන සඳහා යෙදෙන කොටස තෝරන්න.

"සැතපුම් විසි දෙකක් දුර පිටිසර ගමක
...................................... ගල් වළක
වැටී සිටිති ඉන් පිට වී ගත නොහැක
යන පණිවුඩය ලැබුණේ මේ වැනි දිනෙක"

(1) ඇතින්නියක් සහ පැටවෙක්
(2) මුව දෙනක් සහ පැටවෙක්
(3) මිනිහෙක් සහ කොටි දෙනක්
(4) අලියෙක් සහ අලි පැටවෙක්

**37.** පහත සඳහන් කවිය අන්තර්ගත වන කෘතිය කුමක් ද?

"කෙළනා ලිය පියවුරු බිත ගැසෙමිනි
විදුනා රළ රොන් වැද වැද වෙසෙසිනි
සොබනා සොමි උවනත නඳ විලසිනි
රඳනා අම කිරණින් පිරි සඳ වැනි"

(1) හංස සංදේශය (2) පරෙවි සංදේශය
(3) කුසදාවත (4) ගිරා සංදේශය

**38.** "පුලා සුවඳ මලවුල් කැරැ වරල් බැඳ
දුලා රන් පතින් සරසා සවන් සොඳ

යන පද්‍ය පාදයේ අර්ථය නිවැරදිව දක්වා ඇති උත්තරය තෝරන්න.

(1) පිපුණු සුගන්ධවත් මල් අවුල් කරමින් කොණ්ඩය බැඳ දුලා නම් රන්පත්වලින් දෙසවන් සරසාගෙන
(2) පිපුණු සුගන්ධවත් මල් ගැවසි කොණ්ඩය බැඳ දිලිසෙන රන්පත්වලින් දෙකන් සරසාගෙන
(3) පුලා නම් කාන්තාව මල්වලින් කොණ්ඩය බැඳගෙන දිලිසෙන රන්පත්වලින් දෙකන් සරසා ගෙන
(4) විල්වල ඇති සුගන්ධවත් මලින් කොණ්ඩය බැඳ දුලා නම් රන්පත්වලින් දෙකන් සරසා ගෙන

**39.** 'මහගෙදර රාත්‍රියක්' නම් පද්‍ය පන්තියේ නිර්මාණකරුවා වන්නේ,

(1) නන්දන වීරසිංහ ය. (2) මහින්ද දිසානායක ය.
(3) රත්න ශ්‍රී විජේසිංහ ය. (4) ගුණසේන ගලප්පත්ති ය.

**40.** 'ගිම්කල තැවුලි මිලි නිල්ගල ගොසාලා' යන පද්‍ය පාදයේ නිල්ගල යනු,

(1) නිල් පැහැති ගල ය. (2) නිල් පැහැති අහස ය.
(3) මොනරා ය. (4) නිල් මැණික ය.

* *

[පස්වැනි පිටුව බලන්න.

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது ]All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

21 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

සිංහල භාෂාව හා සාහිත්‍යය I, II
சிங்களமொழியும் இலக்கியமும் I, II
Sinhala Language and Literature I, II

## සිංහල භාෂාව හා සාහිත්‍යය II

* ප්‍රශ්න **සියල්ලට ම** උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන **80**කි.

**1.** (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ** නම්, එහි **අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් (අ) මූර්ධජ (ආ) මහාප්‍රාණ අක්ෂර සහිත වචනය බැගින් වෙන් වෙන්ව ලියන්න.
"මහනුවර දළදා පෙරහැර සිංහලයන්ගේ ආගමික භක්තිය ප්‍රකාශ කෙරෙන සංස්කෘතිකාංගයකි."

(ii) පහත දැක්වෙන පද විසන්ධි කොට ලියන්න.
(අ) පිළිතුරු (ආ) අරුණෝදය

(iii) පහත සඳහන් (අ) සහ (ආ) යටතේ දැක්වෙන අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියන්න.
(අ) තොටුපළෙහි නියුතු තැනැත්තා (ආ) බොහෝ ඇසූ පිරූ තැන් ඇති

(iv) පහත සඳහන් වාක්‍යයේ වචන **දෙකක** අක්ෂර වින්‍යාසය සදොස් ය. ඒ වචන දෙක පමණක් නිදොස් කර නැවත ලියන්න.
"විශිෂ්ඨ ජයග්‍රහණයක් ලැබූ ශ්‍රී ලංකා ක්‍රිකට් කන්ඩායම ජනාධිපතිතුමාගේ ඇගයීමට පාත්‍ර විය."

(v) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් (අ) නිපාත සහ (ආ) උපසර්ග පදය බැගින් ලියන්න.
"දුසිරිතෙන් වැළකීම වූ කලී යහපත් සමාජයක් ගොඩනැගීමේ මූලික අඩිතාලම වේ."

(vi) පහත සඳහන් (අ) සහ (ආ)හි දැක්වෙන පදවලට **විරුද්ධාර්ථ** පදය බැගින් ලියන්න.
(අ) මිතුරු (ආ) තැත

(vii) පහත සඳහන් (අ) සහ (ආ)හි දැක්වෙන වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර නැවත ලියන්න.
(අ) අම්මාත් නංගීත් දර කඩයි. (ආ) කාර්යාලයට මිනිස්සු පැමිණ ඇත.

(viii) පහත සඳහන් (අ) සහ (ආ)හි දැක්වෙන වාක්‍යවල **තද කළු** අකුරින් මුද්‍රිත පද අයත් වන ක්‍රියා වර්ගය නම් කරන්න.
(අ) මනාප **ලැබුණොත්** ඔහු ජයග්‍රහණය කරාවි.
(ආ) **බලවූ** පොළොන්නරු අනුරාපුර පෙදෙස.

(ix) පහත සඳහන් වාක්‍ය දෙක කර්මකාරකයට හරවා ලියන්න.
(අ) ජනාධිපතිතුමා වප්මඟුල් උත්සවයට සහභාගි වූ ගොවීන් පිළිගත්තේ ය.
(ආ) මගීහු උද්ඝෝෂණයට සහභාගි වූ සිසුන් විවේචනය කරති.

(x) පහත සඳහන් (අ) සහ (ආ)හි වාක්‍යවල හිස්තැන් සම්පූර්ණ කිරීම සඳහා සුදුසු යෙදුම වරහන් තුළ දී ඇති වචන අතුරෙන් තෝරා ලියන්න.
(අ) ශ්‍රී ලංකාවේ ග්‍රාමීය විදුලිබල යෝජනා ක්‍රම ගණනාවක් ම ක්‍රියාත්මක වන බව පුවත්පත් වාර්තාවලින් ............................... .
(1) හෙළි වන්නාහ (2) හෙළි වේ (3) හෙළි වූහ (4) හෙළි කරති
(ආ) ............................... ආදරයෙන් දරුවන් ඇති දැඩි කරති.
(1) මව (2) මැණියන් (3) මැණියෝ (4) මවුවරුන්

(ලකුණු 20 යි)

[හයවැනි පිටුව බලන්න.

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

**2.** පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් **එකක්** තෝරාගෙන **වචන 250කට නොඅඩු** වන සේ රචනයක් ලියන්න. ඒ සඳහා **යෝග්‍ය මාතෘකාවක්** ද යොදන්න.

(අ) මාර්ග තදබදය ශ්‍රී ලංකාවේ දිනෙන් දින ම උග්‍රවන ගැටලුවක් බවට පත්ව තිබේ. මේ හේතුවෙන් සිදු වන ඉන්ධන දහනය එක් අතකින් පරිසර දූෂණයට ද අනෙක් අතින් ජාතික ධනය නිකරුණේ විනාශ වීමට ද බලපායි. ඊට අමතරව නියමිත වේලාවට කාර්යාලවල සේවයට වාර්තා කිරීමට බොහෝ දෙනෙකුට අපහසු වීම නිසා එය රටේ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කෙරෙහි ද බලපායි. එක් පුද්ගලයෙකුට වාහන කිහිපයක් පැවතීම, මාර්ග පද්ධතිය පුළුල් නොවීම, ප්‍රමාණවත් පොදු ප්‍රවාහන සේවාවක් නොපැවතීම වැනි කරුණු හේතුවෙන් උග්‍රවන මේ ගැටලුව විසඳීමට බලධාරීන්ගේ අවධානය යොමු විය යුතු ය.

(ආ) අවම වියදමකින් ප්‍රේක්ෂකයන්ට උපරිම වින්දනයක් ලබා දිය හැකි විනෝදාස්වාදක මාධ්‍යයක් වශයෙන් ඇතැමෙක් වීථි නාට්‍ය හඳුන්වති. ප්‍රසිද්ධ ස්ථානවල රැස්ව සිටින ජනතාවට කිසියම් පණිවුඩයක් ආකර්ෂණීයව සන්නිවේදනය කිරීමට මෙමගින් පිටුබලයක් සැපයේ. මෙරට තැන්තැන්වල විසිරී සිටින වීථි නාට්‍යයෙහි හසළ කලාකරුවන්ට කිසියම් අනුග්‍රහයක් දක්වා විධිමත් ව සංවිධානය කළහොත් මේ නාට්‍ය විශේෂය සාමාන්‍ය ජනයා අතර ජනප්‍රිය කලා මාධ්‍යයක් බවට පත් කළ හැකි ය.

(ඉ) පොදු ප්‍රවාහන සේවාවට අයත් රථවාහන, පොදු ගොඩනැගිලි මෙන්ම මුදල් නෝට්ටු වැනි මහජනයාගේ පරිහරණය සඳහා රජය විසින් ප්‍රදානය කොට තිබෙන දේපළවලට ද හානි කිරීම ඇතැම් පුද්ගලයන්ගේ විනෝදාංශයක් බවට පත්ව තිබේ. රජයට අයත් මෙම පොදු සේවාවන් විනාශ කිරීමේ ප්‍රතිවිපාක සෑම රටවැසියෙකුට ම විඳීමට සිදු වේ. මේ පිළිබඳ අවබෝධයකින් තොරව පොදු දේපළවලට හානි කරන පුද්ගලයන් දැනුවත් කිරීමේ හා ඔවුනට විරුද්ධව නීත්‍යානුකූලව කටයුතු කිරීමේ විධිමත් ක්‍රමෝපායයන් සැකසිය යුතු වේ.

(ඊ) රටක පවත්නා ස්වාභාවික සම්පත් අතර වනජීවීන්ට හිමි වන්නේ උසස් තැනකි. වනසතුන් නැරඹීම සඳහා ම විදේශිකයන් මෙරටට පැමිණෙන බැවින් වනසත්තු විදේශ විනිමය උල්පත් ය. කෙටි කාලීන වාසි අපේක්ෂා කරන මිනිසුන් විසින් වනසතුන්ට කෙරෙන හානි පිළිබඳ ව ජනමාධ්‍යවලින් නිතර අසන්නට ලැබේ. මෙබඳු හානි වළක්වා වනජීවී සම්පත සුරක්ෂිත කිරීම කාලීන අවශ්‍යතාවකි.

(ලකුණු 25 යි)

**3.** පහත සඳහන් පාඨය වචන **50 - 60** අතර වන සේ **සාරාංශ කොට ලියන්න**. ඔබේ සාරාංශයේ වචන සංඛ්‍යාව උත්තරය අග ලියන්න.

අන්තර්ජාල සමාජ ජාලකරණය පිළිබඳ එක් වැදගත් සංකල්පයක් වන්නේ ඒවා තුළින් අන් අය සමග ජීවිතය බෙදා ගැනීමට ඉඩ සැලසීම යන්නයි. එහි දී තමන් සිතන පතන දෑ, ඡායාරූප හා වීඩියෝ දර්ශන යනාදිය තම මිතුරුමිතුරියන් හා හුවමාරු කර ගැනීමට පහසුවෙන් අවකාශය හිමි වේ. ඒ අනුව මෙම ක්‍රමවේදය මිතුරු ජාල සේවා වෙබ් අඩවිවල ප්‍රධානතම පහසුකමක් වන අතර එය සමාජ ජාල සංකල්පයේ මූලික ම අනන්‍යතාව විද්‍යමාන කරන ලක්ෂණයක් ද වේ.

අද්‍යතනයේ මිතුරු ජාල සේවා වෙබ් අඩවිවල දැකිය හැකි වඩාත් ප්‍රචලිත අංගයක් වන්නේ ප්‍රතිරූප ප්‍රවර්ධනය සඳහා එම වෙබ් අඩවි සාර්ථකව භාවිත කළ හැකි වීමයි. ඒ සඳහා පිටු නිර්මාණය කළ හැකි අතර ඒවාට ග්‍රාහක ප්‍රතිචාර ලබා ගැනීම ඔස්සේ ඒවායේ ජනප්‍රියතාව ඉහළ නැංවිය හැකි ය. විශේෂයෙන් ම දේශපාලනඥයින්, නළුනිළියන්, ගායකගායිකාවන් ඇතුළු විවිධ තලවල පුද්ගලයෝ අද වන විට මෙම සමාජ ජාල ක්‍රමවේදය ඔස්සේ සිය ජනප්‍රියතාව වැඩි කර ගැනීමට කටයුතු කරති.

පුද්ගල ප්‍රතිරූපය ප්‍රවර්ධනය සඳහා මෙන් ම ආයතනික ප්‍රතිරූප ප්‍රවර්ධනය කිරීම උදෙසා ද මෙම ක්‍රමවේදය ඔස්සේ ග්‍රාහක ආකර්ෂණය ලබා ගැනීමට මිතුරු ජාල සේවා වෙබ් අඩවි මගින් අවස්ථාව සැලසේ. ඊට අමතරව විවිධ ප්‍රවර්ධන වැඩසටහන්, දේශපාලන ව්‍යාපාර ඇතුළු ඕනෑම ආකාරයක ප්‍රවර්ධනය කිරීමක්, මතවාද බෙදාහැරීමක් හෝ මතවාද නිර්මාණය කිරීමක් උදෙසා මෙම ක්‍රමවේදයේ භාවිතය අද්‍යතනයේ ජනප්‍රිය විලාසිතාවක් බවට පත්ව තිබේ.

(ලකුණු 10 යි)

**4.** පහත දැක්වෙන පාඨය කියවා අසා ඇති **ප්‍රශ්නවලට උත්තර** සපයන්න.

ඇතැම් රජුන්ගේ ආගමික කටයුතු අතර චෛත්‍ය, ප්‍රතිමා ගෘහ ආදියෙහි චිත්‍ර ඇඳීම හා අඳින ලද චිත්‍ර අලුත්වැඩියා කිරීම පිළිබඳ කරුණු වංසකථාවල සඳහන් වෙයි. මෙසේ එක් අතකින් පොදු ජන ශිල්පියා ද අනෙක් අතින් රාජ සභා චිත්‍රකාරයා ද ස්වකීය කාර්යයන්හි යෙදෙද්දී සිංහල චිත්‍ර කලාව කෙරෙහි ඉන්දියාවේ ගුප්ත රජුන් යටතෙහි දියුණු වූ ශ්‍රේෂ්ඨ සංස්කෘතිය බලපාන්නට පටන් ගත්තේ ය. අජන්තා, භාග් ආදි ගුහාවල ඇති සිතුවම් වැඩි කොටසක් ද සීගිරි චිත්‍ර ද අඳින ලද්දේ මෙකල දී ය.

සීගිරි සිතුවම්වලින් සිංහල චිත්‍ර කලා ඉතිහාසයේ අමුතු ම පරිච්ඡේදයක් ආරම්භ වූවා පමණක් නොව ලංකාවට අද්විතීය කීර්තියක් ද ලැබුණේ ය. සීගිරි හා අජන්තා චිත්‍ර අතර සැලකිය යුතු සමානත්වයක් විද්‍යමාන වුව ද, සීගිරි චිත්‍ර හුදෙක් අජන්තාවේ බලපෑමෙන් ඇති වූයේ යයි නිගමනය කළ යුතු නොවෙයි. සීගිරි හා අජන්තා සම්ප්‍රදායයන් අතර සමානකම් දක්නා ලැබෙතුදු සීගිරි සිතුවම් මෙරට සිංහල සිතුවම් කලාවේ ම දියුණු අවස්ථාවක් ලෙස සැලකිය හැකි වනුයේ මේවා පැරණි සිංහල චිත්‍ර හා සසඳා බැලූ විට පමණි. රේඛා මාර්ගයෙන් ඇඳීමේ සම්ප්‍රදායය සීගිරි හා අජන්තා චිත්‍රවල පමණක් නොව පැරණි සිංහල ක්‍රමයේ ද ලක්ෂණයකි.

[හත්වැනි පිටුව බලන්න.

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

මේ සීගිරි ළඳුන්ගේ රූප අමරාවතියේ ගල් කැටයම්වල දැක්වෙන ස්ත්‍රීන්ට සමානකම් ඇති වීම සැලකිය යුතු කරුණකි. එකල ලංකාවේ පැතිරුණු ප්‍රතිමා ක්‍රමයේ ප්‍රභවය සිදු වූයේ ඉන්දියාවේ නැගෙනහිර වෙරළෙහි පිහිටි ක්‍රිෂ්ණා නදිය ආශ්‍රිත ප්‍රදේශයේ හෙයිනි. ආන්ධ්‍ර යුගයට අයත් වූ අද සම්පූර්ණයෙන් අභාවයට ගිය චිත්‍ර කලා සම්ප්‍රදායයක් ගැන අනුමාන කිරීමට සීගිරි සිතුවම් නිසා ඉඩ ලැබෙන්නේ ය.

(i) ඇතැම් රජවරුන්ගේ ආගමික කටයුතු වශයෙන් වංසකතාවල දැක්වෙන්නේ මොනවා ද?

(ii) සිංහල චිත්‍ර කලාව කෙරෙහි බලපෑම් ඇති වූයේ ඉන්දියාවේ කවර රජවරුන්ගේ සංස්කෘතිය යටතේ ද?

(iii) සීගිරි චිත්‍ර හා සමකාලීන යයි කතුවරයා දක්වන්නේ කවර චිත්‍ර ද?

(iv) මෙහි දැක්වෙන අන්දමට පැරණි සිංහල චිත්‍රවලින් පවා නිරූපිත සම්ප්‍රදාය කුමක් ද?

(v) ලේඛකයා සීගිරි ළඳුන්ගේ රූප සමාන කොට ඇත්තේ කුමකට ද?

(ලකුණු 10 යි)

5. 'සඳගලතැන්න' පාසලේ කාර්යාල කටයුතු කරගෙන යෑම සඳහා මිල දී ගත් පරිගණක යන්ත්‍රය ක්‍රියාවිරහිත වී ඇත. එය මිල දී ගෙන ඇත්තේ කිසියම් දෝෂයක් ඇත්නම් වසර 3ක් ඇතුළත නොමිලයේ අලුත්වැඩියා කිරීමේ පදනම මත ය. සඳගලතැන්න පාසලේ පරිගණක ක්‍රියාකරු සුරේශ් පතිරණ ඔබ යැයි උපකල්පනය කර පරිගණක යන්ත්‍රය අලුත්වැඩියා කරදෙන ලෙස ඉල්ලා කොළඹ 10, මරදාන 'නිත්‍යා' පරිගණක ආයතනයේ කළමනාකරු වෙත යැවීම සඳහා රාජකාරි ලිපියක් සකස් කරන්න.
(මේ සඳහා වචන **100**ක් පමණ ප්‍රමාණවත් ය.)

**නැතහොත්**

පොල්වතුයාය ග්‍රාමයට දීර්ඝ කාලයක් තිස්සේ අඩුපාඩුවක්ව පැවති ක්‍රීඩාංගණය මධ්‍යම පළාත් සභාවේ මූල්‍ය දායකත්වයෙන් සියලු පහසුකම් සහිත ව ඉදිකොට නිමවා ඇත. 2018 ජනවාරි 01 දින පෙරවරු 10ට එය මහජන අයිතියට පැවරීමට නියමිත ය. එදින ප්‍රධාන අමුත්තා වශයෙන් සහභාගි වන්නේ මධ්‍යම පළාත් සභා මහ ඇමති පණ්ඩුක සිරිනාග මහතා ය. පොල්වතුයාය 'රන්රැස්' ක්‍රීඩා සමාජයේ ලේකම් කපිල ගමගේ ඔබ යයි උපකල්පනය කොට මේ කාර්යය සඳහා සුදුසු ආරාධනා පත්‍රයක් සකස් කරන්න.
(මේ සඳහා වචන **100**ක් පමණ ප්‍රමාණවත් ය.) (ලකුණු 15 යි)

* * *

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

14560

OL/2017/21/S-III (OLD)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

(පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus)

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

21 S III

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

| | | |
|---|---|---|
| සිංහල භාෂාව හා සාහිත්‍යය III | | පැය දෙකයි |
| சிங்களமொழியும் இலக்கியமும் III | | இரண்டு மணித்தியாலம் |
| Sinhala Language and Literature III | | Two hours |

**සිංහල භාෂාව හා සාහිත්‍යය III**

**වැදගත් :** උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් උත්තර සපයන්න.
※ **1, 2, 3, 4** ප්‍රශ්නවලටත්, **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකටත්** උත්තර සපයන්න.
මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන **80**කි.

**1.** (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) "මම උඹට කවදත් ආදරය කෙරුවෙ පුතෙකුට වගෙයි."
(අ) මෙම ප්‍රකාශය කරන්නේ කවරෙක් ද?
(ආ) මෙම ප්‍රකාශය ඇතුළත් නාට්‍යයේ නම කුමක් ද?

(ii) "මැනැවි ද පින්වතුට
කියා **පිළිවිසියෝ** දෙදෙන සිට"
(අ) මෙම කවි දෙපදය අයත් කෘතිය කවර සාහිත්‍ය යුගයකට අයත් ද?
(ආ) මෙහි ඇතුළත් **පිළිවිසියෝ** යන වචනයෙහි අර්ථය කුමක් ද?

(iii) "මගේ ඇඟ ගැහෙන්න පටන් ගත්තා. හොඳට ම දාඩියත් දැම්මා."
(අ) මෙහි මගේ යනුවෙන් හැඳින්වෙන්නේ කවුරුන් පිළිබඳව ද?
(ආ) මහාචාර්ය ඒ. වී. සුරවීර විසින් රචනා කරන ලද කෙටිකතා සංග්‍රහ **දෙකක** නම් ලියන්න.

(iv) (අ) 'කිඳුරු වලප' පද්‍ය පන්තිය උපුටාගෙන ඇත්තේ කුමන කෘතියෙන් ද?
(ආ) එය කවර සාහිත්‍ය යුගයකට අයත් ද?

(v) (අ) කාව්‍ය පිළිබඳ විචාරය කිරීමේ දී ඔබ අසා ඇති කාව්‍ය ප්‍රබන්ධ ආකෘති **දෙකක** නම් ලියන්න.
(ආ) 'පියසේන ඇසූ ප්‍රශ්නයක්' පද්‍ය පන්තිය රචනා කොට ඇත්තේ කවර ආකෘතියෙන් ද?

(vi) "මේ තැන් පටන් නුඹ වහන්සේ ද මාගේ පියාණන් වහන්සේ ම ය."
(අ) මෙම ප්‍රකාශය කරන්නේ කිනම් අවස්ථාවක ද?
(ආ) මෙම ප්‍රකාශයෙහි ඇතුළත් 'නුඹ වහන්සේ' යනු කවුරුන් ද?

(vii) (අ) උත්තරෝලිය වස්තුව උපුටාගෙන ඇත්තේ කිනම් ග්‍රන්ථයකින් ද?
(ආ) එය රචනා කර ඇත්තේ කිනම් පරමාර්ථයකින් ද?

(viii) (අ) පන්සිය පනස් ජාතක පොත කිනම් සාහිත්‍ය යුගයේ රචනා වූවක් ද?
(ආ) පන්සිය පනස් ජාතක පොතට මූලාශ්‍රය වී ඇත්තේ කුමක් ද?

(ix) "දෙනෝදහක් අඟනෝ මට මල් නෙළුවා
අනෝතත්ත විල මැද යහනක හිඳුවා"
(අ) මෙම පද්‍යයේ ඉතිරි පේළි දෙක ලියා දක්වන්න.
(ආ) මෙම පද්‍යය අයත් වන කෘතිය නම් කරන්න.

(x) (අ) 'වැස්ස' පද්‍ය පන්තියේ කතුවරයා නම් කරන්න.
(ආ) ඔහු අයත් සාහිත්‍ය යුගය හා කවි පරපුර කුමක් ද?

(ලකුණු 02 × 10 = 20 යි.)

[දෙවැනි පිටුව බලන්න.

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

**2.** පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨවල **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටස්වල අර්ථය වෙන් වෙන් ව ලියන්න. ඉන් පසු මුළු කොටසේ ම අර්ථය ලිහිල් බසින් ලියන්න.

(i) "එකලැ ඔහු අතින් පැන් ගෙන නිධානයට ගැසූහ. **එකෙණෙහි** ඒ නිධානය **මෝවිටින්** නික්ම මහත් වූ ධනරාසියක් සිට ගත."

(ii) "මහසෙන් රැස් ව කුඩ කොඩි ගෙනවට කරට
අහසින් ඇවිත් **බට තරුවක්** දෙරණ පිට
විගසින් ඇහිඳ ගත්තෙමි **අමයුරු** ලෙසට
සීනෙන් තරුව ගිලුණා මගෙ ගැබ තුළට"

(iii) "මෙම **පෞරාණික** වාහනයේ ඉඩ ඇති අසුනක පහසු ලෙස හිඳගත් මට, මොහොතකට සියල්ල අමතක විය. වාහනය ගැස්සෙමින් ද පැද්දෙමින් ද පරණ නගරයේ **අබලන්** පාර දිගේ ඇදෙන්නට විය."

(iv) "මංසලෙන් සල නැගූ තොරණින්
**මහරු** සම්බුදු සිරිත දිස් විය
උවසු උවැසිය ගැයූ බැති ගී
අරම පිස **වාගැබට** එක් විය"

(ලකුණු 05 × 04 = 20 යි.)

- **3, 4** යන ප්‍රශ්න සඳහා වන උත්තරයක වචන **125**ක් පමණ තිබීම සෑහේ.

**3.** (i) සරල භාෂාව
(ii) අත්දැකීම් සංයමයෙන් ඉදිරිපත් කිරීම

'පියසේන ඇසූ ප්‍රශ්නයක්' පද්‍ය පන්තියේ මූලික ලක්ෂණ වේ. එක් කරුණකට නිදසුන් **දෙක** බැගින් දක්වමින් විමසන්න. (ලකුණු 15 යි.)

**නැතහොත්**

'අපටත් දවසක ඉර පායාදෝ' කෙටිකතාව සාර්ථකත්වයට පත්වීම උදෙසා
(i) භාෂාව
(ii) සිද්ධි මාලාව හා කථන ක්‍රමය ඉවහල් වී ඇති ආකාරය එක් කරුණකට නිදසුන් **දෙක** බැගින් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 15 යි.)

**4.** 'හත්ත හත්තික සිටාණෝ' කතාව පාඨකයාගේ සිත් ඇදගන්නාසුලු කතාවකි. එහි
(i) භාෂාව භාවිතය සහ
(ii) චරිත නිරූපණය
යන එක් එක් කරුණකට නිදසුන් **දෙක** බැගින් දක්වමින් විමසන්න. (ලකුණු 15 යි.)

**නැතහොත්**

'වසන්ත සමය' පද්‍ය පන්තියෙහි සාර්ථකත්වයට බෙහෙවින් ම බලපා ඇත්තේ,
(i) විචිත්‍ර පරිසර වර්ණනා සහ
(ii) සරල භාෂා භාවිතයයි.
එක් කරුණකට නිදසුන් **දෙක** බැගින් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 15 යි.)

- **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකට** පමණක් උත්තර ලියන්න. උත්තරයක වචන **100**ක් පමණ තිබීම සෑහේ.

**5.** රසික හදවත් තුළ කරුණා රසය ජනනය කරවීම 'කිඳුරු වලප' පද්‍ය පන්තියේ මූලික අරමුණ වී ඇත. අදාළ නිදසුන් **තුනක්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි.)

**6.** ස්වකීය වෘත්තිය සම්බන්ධයෙන් පැවති සුවිශේෂ හැකියාවත් මානව දයාවත් හේතුවෙන් ජීවක වෛද්‍යවරයාගේ චරිතය ශ්‍රේෂ්ඨත්වයට පත්ව ඇති ආකාරය අදාළ නිදසුන් **තුනක්** දක්වමින් 'ජීවක කතා වස්තුව' ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10 යි.)

**7.** වැස්ස නිසා පුද්ගල මනසෙහි හට ගැනෙන සොම්නස තත්ත්වාකාරයෙන් නිරූපණය කිරීමට 'වැස්ස' පද්‍ය පන්තියේ කතුවරයා ඇත් වූ කුසලතාව අදාළ නිදසුන් **තුනක්** දක්වමින් අගයන්න. (ලකුණු 10 යි.)

* * *

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/